**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**වර්ෂ 2015 අංක 03 දරණ ශිෂ්‍ය සංගම් අතුරු ව්‍යවස්ථාව**

සංශෝධිත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 135 වගන්තිය සහ 112 (3) වගන්තිය යටතේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභාව විසින් සම්පාදිත අතුරු ව්‍යවස්ථාවකි.

**1.** මෙම අතුරු ව්‍යවස්ථාව, වර්ෂ 2015 අංක 03 දරණ ශිෂ්‍ය සංගම් අතුරු ව්‍යවස්ථාව ලෙසින් සඳහන් කළ යුතු ය. වර්ෂ 2015 අංක 03 දරණ මෙම අතුරු ව්‍යවස්ථාව බලාත්මක වීමත් සමග වර්ෂ 2000 අංක 03 දරණ ශිෂ්‍ය සංගම් අතුරු ව්‍යවස්ථාව අහෝසි වූවා සේ සැළකේ.

**I කොටස**

**පීඨ ශිෂ්‍ය සංගමය**

2. **(I)** ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨය සදහා පීඨ ශිෂ්‍ය සංගමයක් පැවතිය යුතු වේ.

**(II)** එක් එක් පීඨය යටතේ ලියාපදිංචි වී ඇති සියළුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් එම පීඨයට අයත් පීඨ ශිෂ්‍ය සංගමය මගින් නියෝජනය විය යුතුය.

**(III)** සාමාජිකයින් දාහත් (17) දෙනෙකුගෙන් පීඨ ශිෂ්‍ය සංගමයක් සමන්විත විය යුතු අතර ඉන් සාමාජිකයින් පහළොස් (15) දෙනෙකු ඡන්දයක් මගින් ඍජුව තෝරා පත් කර ගතයුතු අතර දෙදෙනෙකු මෙම අතුරු ව්‍යවස්ථවේ **II** කොටසේ සඳහන් පරිදි තෝරා පත් කර ගත් පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයන් විය යුතුය. ඡන්දය මගින් ඍජුව තෝරා පත් කර ගත යුතු සාමාජිකයින් පහළොස් (15) දෙනාගෙන් අවම වශයෙන් සාමාජිකයින් හතර (4) දෙනෙකු කාන්තාවන් විය යුතුය.

**2016 අංක 01 දරණ සංශෝධනයේ අංක 2.II වගන්තිය පරිදි**

**(IV)** මෙම අතුරු ව්‍යවස්ථාවේ 44 වන වගන්තිය මගින් ප්‍රතිපාදන සලසා ඇති පරිදි, තේරී පත් වූ, එක් එක් පීඨ ශිෂ්‍ය සංගම්වල සාමාජිකයන් විසින්, පීඨ ශිෂ්‍ය සංගමයට අයත් පහත සදහන් නිළධාරීන්ගෙන් සමන්විත කමිටුවක් ඔවුනොවුන් අතුරින්ම තෝරා පත් කර ගත යුතු වේ.

(අ) සභාපති

(ආ) උප සභාපති

(ඇ) ලේකම්

(ඈ) සංස්කාරක

(ඉ) කනිෂ්ට භාණ්ඩාගාරික

(V) පීඨ ශිෂ්‍ය සංගමයේ නිලධාරීන් පස්(5) දෙනා අතරින් අවම වශයෙන් නිලධාරීන් දෙදෙනෙකු වත් කාන්තාවන් (ශිෂ්‍යාවන්) විය යුතු ය. එසේ වුවද, ප්‍රමාණවත් ශිෂ්‍යාවන් ගණනක් පීඨ ශිෂ්‍ය සංගම් සාමාජිකයින් ලෙස තේරී පත්ව නැතිනම් මෙම ප්‍රතිපාදනය අදාළ නොවේ.

## II කොටස
## පීඨ සභාවන්ට ශිෂ්‍ය නියෝජිතයින් පත් කිරීම

3. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 48 (1) (ඉ) ව්‍යවස්ථාව අනුව, මින් ඉදිරියට පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයින් ලෙස හැඳින්වෙන ශිෂ්‍ය නියෝජිතයින් දෙදෙනෙකු (02) එක් එක් පීඨ සභාවට සිටිය යුතු වේ.

4. පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයින් ලෙස පත් කර ගන්නා සාමාජිකයින්, ඡන්දයක් මගින් එම නිලවරණයේ දී ම පීඨ ශිෂ්‍ය සභාවේ සාමාජිකයන් තෝරා ගන්නා පරිදිම තෝරා ගත යුතු වේ.

5. පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයන් තෝරා පත් කර ගැනීම සඳහා වෙනම නාම යෝජනා කැඳවිය යුතු අතර, පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයන් තෝරා ගැනීම සම්බන්ධයෙන් වෙනම ඡන්ද පත්‍රිකාවක් ශිෂ්‍යයන් විසින් භාවිත කළ යුතු වේ.

6. යම් ශිෂ්‍යයෙක් එම ශිෂ්‍ය සංගම් වර්ෂය සඳහා පීඨ ශිෂ්‍ය සංගමයේ සාමාජිකයෙකු ලෙස නම් කර ඇත්නම් ඔහු/ ඇය පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයෙක් ලෙස නම් නොකළ යුතු වේ.

7. පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයින් දෙදෙනා, අදාල පීඨයේ ශිෂ්‍ය සංගමයේ සහ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ සාමාජිකයින් විය යුතු අතර, එසේ වුව ද, ඔවුන් එකී පීඨ ශිෂ්‍ය සංගමයේ හෝ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ නිලධාරීන් ලෙස තෝරා පත් කර ගැනීමට සුදුස්සන් නොවිය යුතු වේ.

## III කොටස
## පීඨ ශිෂ්‍ය සංගමයේ සහ පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයින් ලෙස නිලවරණයට ඉදිරිපත් වීම සඳහා යෝග්‍යතාවය

8. යම් අපේක්ෂකයෙකු පීඨ ශිෂ්‍ය සංගමයේ සාමාජිකයෙකු ලෙස හෝ පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයෙකු ලෙස තෝරා පත් කර ගැනීම සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමට

කිරීමට සුදුස්සෙකු වීමට නම්,

**(I)** ඔහු/ඇය වර්තමානයේ ලියාපදිංචි වී ඇති අධ්‍යයන වැඩසටහනෙන් 1/3 ප්‍රමාණයක් හෝ සම්මාන 24 ක් යන දෙකෙන් අවම සුදුසුකම සම්පූර්ණ කර තිබීම. **2016 අංක 01 දරණ සංශෝධනයේ අංක 2.III වගන්තිය පරිදි**

සහ

**(II)** ඔහු/ඇය පීඨ ශිෂ්‍ය සභාවක සාමාජිකයෙකු ලෙස හෝ පීඨ සභාවක ශිෂ්‍ය නියෝජිතයෙකු ලෙස තේරී පත් වීම සඳහා නිලවරණයට ඉදිරිපත් වන අධ්‍යයන වර්ෂය තුළ, අදාල අධ්‍යයන වැඩසටහනේ අවම වශයෙන් සම්මාන 18 ක් සඳහා වත් ලියාපදිංචි වී තිබිය යුතු වේ. කෙසේ වුව ද යම් අපේක්ෂකයෙකු අධ්‍යයන වැඩසටහනේ අවසන් වසර ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක නම් සහ සම්පූර්ණ කළ යුතු සම්මාන ප්‍රමාණය 18 ට වඩා අඩු වන අවස්ථාවක ඔහු/ඇය එම පාඨමාලාව සම්පූර්ණ කිරීම පිණිස අවශ්‍ය ඉතිරි සියලුම සම්මාන සඳහා ලියාපදිංචි වී තිබිය යුතු වේ.

9. ශිෂ්‍යභාවය අත්හිටුවීමකට ලක්ව සිටින ශිෂ්‍යයෙකු පීඨ ශිෂ්‍ය සංගමයක හෝ පීඨ සභාවක ශිෂ්‍ය නියෝජිතයෙකු ලෙස නිලවරණයට ඉදිරිපත් වීමට සුදුස්සෙකු නොවිය යුතු ය. **2016 අංක 01 දරණ සංශෝධනයේ අංක 2.IV වගන්තිය පරිදි**

10. යම් ශිෂ්‍යයකු, ඔහු/ඇය ලියාපදිංචි වී සිටින අධ්‍යයන පාඨමාලාවන් සංඛ්‍යාව නොසළකා,මතු දැක්වෙන අවස්ථා වන,

(අ) අනුක්‍රමිකව පැවතීම අත්‍යවශ්‍ය නොවන දෑවුරුදු ශිෂ්‍ය සංගම් කාලසීමාවක් තුළ විශ්වවිද්‍යාලයේ කිනම් හෝ පීඨ ශිෂ්‍ය සංගමයක හෝ,

(ආ) අනුක්‍රමිකව පැවතීම අත්‍යවශ්‍ය නොවන දෑවුරුදු ශිෂ්‍ය සංගම් කාලසීමාවක් තුළ විවෘත විශ්වවිද්‍යාලයේ කිනම් හෝ පීඨ සභාවක ශිෂ්‍ය නියෝජිතයකු ලෙස, හෝ

(ඇ) අනුක්‍රමිකව පැවතීම අත්‍යවශ්‍ය නොවන දෑවුරුදු ශිෂ්‍ය සංගම් කාලසීමාවක් තුළ විවෘත විශ්ව විද්‍යාලයේ කිනම් හෝ පීඨ ශිෂ්‍ය සංගමයක එක් වතාවකුත්, කිනම් හෝ පීඨ සභාවක ශිෂ්‍ය නියෝජිතයෙකු ලෙස එක් වතාවකුත් ලෙස

මීට ඉහත දී තෝරා පත් කර ගන්නා ලද යම් ශිෂ්‍යයෙකු, කිනම් හෝ පීඨ ශිෂ්‍ය සංගමයක හෝ පීඨ සභාවක ශිෂ්‍ය නියෝජිතයෙකු ලෙස තේරී පත් වීමට යෝග්‍යතාව නොලබනු ඇත.

11. කිනම් හෝ පීඨ සභාවක ශිෂ්‍ය නියෝජිතයෙකු ලෙස තෝරා පත් කර ගැනීම සඳහා නාම යෝජනා වී ඇති අපේක්ෂකයෙකු, එම ශිෂ්‍ය සංගම් වර්ෂය තුළ කිසිදු පීඨ ශිෂ්‍ය සංගමයකට තෝරා පත් කර ගැනීම සඳහා නාම යෝජනා නොකළ යුතු වේ.

12. කිනම් හෝ පීඨ ශිෂ්‍ය සංගමයකට තේරී පත් වීම සඳහා නාම යෝජනා කර ඇති අපේක්ෂකයෙකු එම ශිෂ්‍ය සංගම් වර්ෂය තුළ කිසිදු පීඨ සභාවක ශිෂ්‍ය නියෝජිතයෙකු ලෙස තෝරා පත් කර ගැනීම සඳහා නාම යෝජනා නොකළ යුතු වේ.

13. යම් අපේක්ෂකයෙකු තේරී පත් වීම සඳහා සුදුසුකම් ලබා තිබේද,නොතිබේද යන්න පිළිබඳ කිනම් හෝ ගැටලුවක් නිලවරණ නිලධාරියා විසින් තීරණය කළ යුතු ය. යම් කිසි ශිෂ්‍යයෙකු මෙම තීරණයෙන් සෑහීමට පත් නොවන්නේ නම්, එම තීරණය ඔහු/ඇය වෙත ලැබී පැය 48 ක් ඇතුලත විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. එවන් අභියාචනයක් සම්බන්ධයෙන් ප්‍රධාන විධායක නිලධාරියා විසින් දෙනු ලබන තීරණය අවසානාත්මක හා තිරණාත්මක වේ.

## IV කොටස
## නිලවරණයකදී ඡන්දය භාවිත කිරීම සඳහා යෝග්‍යතාව

14. පීඨ ශිෂ්‍ය සභාවක සාමාජිකයෙකු ලෙස හෝ පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයෙකු ලෙස තෝරා පත් කර ගැනීමේ කාර්යය සඳහා විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයන්හි ලියාපදිංචි ශිෂ්‍යයන් එක් එක් ඡන්ද කොට්ඨාසයන් ලෙස සැළකිය යුතුය.

15. **(I)** පීඨ ශිෂ්‍ය සභාවක සාමාජිකයෙකු ලෙස හෝ පීඨ සභාවක ශිෂ්‍ය නියෝජිතයෙකු ලෙස තෝරාපත් කර ගැනීමේ නිලවරණයකදී ඡන්දය භාවිත කිරීමට නම්, යම් ශිෂ්‍යයෙක් යම් අධ්‍යයන පාඨමාලාවක තුන් වන (3) මට්ටම හෝ ඉහළ මට්ටමක අවම සම්මාන නවයක් (9) සඳහා වත් ලියාපදිංචි වී තිබිය යුතු ය.

**(II)** යම් ශිෂ්‍යයෙක්,

(අ) නිලවරණය ප්‍රකාශයට පත් කරන දිනයට පෙර ඔහුගේ/ඇයගේ ශිෂ්‍යලියාපදිංචිය අලුත් කරවා ගැනීමට අපොහොසත් වී ඇත්නම්,

(ආ) ශිෂ්‍යභාවය අත්හිටුවීමකට යටත්ව ඇත්නම්,

එවැනි නිලවරණයක දී ඡන්දය භාවිත කිරීමට සුදුස්සෙක් නොවනු ඇත.

**2016 අංක 01 දරණ සංශෝධනයේ අංක 2.IV වගන්තිය පරිදි**

16. යම් කිසි ශිෂ්‍යයෙකු ඡන්දය භාවිතා කිරීම සඳහා සුදුසුකම් ලබා තිබේ ද නොතිබේ ද, යන ප්‍රශ්නය නිලවරණ නිලධාරියා විසින් තීරණය කළ යුතු ය. එවැනි තීරණයකින් අතෘප්තියට පත් යම් කිසි ශිෂ්‍යයෙකුට එම තීරණය ඔහු/ඇය වෙත ලැබී පැය 48 ක් ඇතුළත විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. එවන් අභියාචනයක් සම්බන්ධයෙන් ප්‍රධාන විධායක නිලධාරියා විසින් දෙනු ලබන තීරණය අවසානාත්මක හා තිරණාත්මක වේ.

17. ශිෂ්‍යයෙකුට ඔහු/ඇය ලියාපදිංචි වී ඇති අධ්‍යයන වැඩසටහන් සංඛ්‍යාව නොසළකා, එක් නිලවරණයක දී එක් ඡන්දයකට වඩා භාවිත කිරීමට හිමිකම නොලැබිය යුතුය. එකී ඡන්දය, එම පීඨයේ ම, පීඨ ශිෂ්‍ය සංගමයේ සාමාජිකයින් සඳහා සහ පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයින් සඳහා භාවිත කළ යුතු වේ.

## V කොටස
## ප්‍රාදේශීය මධ්‍යස්ථාන වශයෙන් නියෝජනය

18. පහත 19 වගන්තියේ සඳහන් ආකාරයට, පීඨ ශිෂ්‍ය සංගම් සහ පීඨ සභාවන්හි ශිෂ්‍ය නියෝජිතයන් සඳහා නාම යෝජනා භාර ගැනීමට මාසයකට පෙර, එක් එක් ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්ගෙන් පීඨ ශිෂ්‍ය සංගමය සඳහා සිටිය යුතු නියෝජිතයන් සංඛ්‍යාව නිලවරණ නිලධාරියා විසින් තීරණය කළ යුතු වේ.

19. **(I)** (අ) එක් එක් පීඨ ශිෂ්‍ය සංගමය සඳහා එක් එක් ප්‍රාදේශීය මධ්‍යස්ථානයෙන් අවම වශයෙන් එක් නියෝජිතයෙකු හෝ සිටිය යුතු වේ. කෙසේ වෙතත්, මේ සඳහා අදාල අධ්‍යයන වර්ෂය තුළ, එකී ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ අවම වශයෙන් ශිෂ්‍යයන් පනහක් (50) වත් එම පීඨයේ උපාධි පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වී සිටිය යුතු වේ.අධ්‍යයන මධ්‍යස්ථානයන්, එක් එක් ප්‍රාදේශීය මධ්‍යස්ථානයන් වෙත යෝග්‍ය පරිදි එකතු කරනු ඇත.

(ආ) ඉහත **19 (I)** (අ) වගන්තියේ සඳහන් ආකාරයට, එක් එක් ප්‍රාදේශීය මධ්‍යස්ථානයෙන් එක් එක් පීඨ ශිෂ්‍ය සංගමයක් සඳහා අවම ශිෂ්‍ය නියෝජිතයින් සංඛ්‍යාව වෙන් කිරීමෙන් පසු, එකී ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි, එම අධ්‍යයන වර්ෂය තුළ උපාධි පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වී සිටින සිසුන් සංඛ්‍යාවේ පදනම මත එක් එක් ප්‍රාදේශීය මධ්‍යස්ථානයන් අතර ඉතිරි ශිෂ්‍ය නියෝජිතයින් සංඛ්‍යාව සමානුපාතික ව බෙදා හැරිය යුතු වේ. අධ්‍යයන මධ්‍යස්ථානයන්, එක් එක් ප්‍රාදේශීය මධ්‍යස්ථානයන් වෙත යෝග්‍ය පරිදි එකතු කරනු ඇත.

**(II)** ඉහත 19 **(I)** (අ) වගන්තියේ සඳහන් ආකාරයට, යම්කිසි ප්‍රාදේශීය මධ්‍යස්ථානයකින් පීඨ ශිෂ්‍ය සංගමයකට ශිෂ්‍ය නියෝජිතයින් නොමැතිනම්, එම

ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ, එම පීඨයේ සිසුන් විසින් ඡන්දය භාවිතා කළ යුත්තේ කුමන ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදීද යන්න නිලවරණ නිලධාරියා විසින් තිරණය කළ යුතු වේ.

20. ඉහත 19 **(I)** වගන්තිය ප්‍රකාර ව තීරණය වන, එක් එක් ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ, එක් එක් පීඨවල, පීඨ ශිෂ්‍ය සංගමයක සිටිය යුතු ශිෂ්‍ය නියෝජිතයින් සංඛ්‍යාව පිළිබඳ කෙරෙන අවසන් වෙන් කිරීම, පස් වන උප ලේඛනයේ දැක්වෙන අකාරයට විය යුතු අතර, එසේ එක් එක් ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ, එක් එක් පීඨයන්ට අදාලව පවතින එම නියෝජිතයන් සංඛ්‍යාව නිලවරණ නිලධාරියා විසින් නිලවරණ පණිවුඩයක් මගින් ශිෂ්‍යයන් වෙත දැනුම් දිය යුතු වේ.

21. එකතු වූ ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි පවත්නා තනතුරු සංඛ්‍යාව සඳහා සෑම ඡන්ද දායක ශිෂ්‍යයෙකු විසින් ම ඔහු/ඇය ලියාපදිංචි වී සිටින ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ දී/අධ්‍යයන මධ්‍යස්ථානයේ දී ඡන්දය භාවිත කිරීමට සුදුසුකම් ලැබිය යුතු වේ . එකතු වූ ප්‍රාදේශීය මධ්‍යසථානයන්ගෙන් තේරී පත් වූ සියලු ශිෂ්‍ය නියෝජිතයන් විසින් පීඨ ශිෂ්‍ය සංගම් කමිටුවක් පිහිටුවා ගත යුතු වේ. සෑම ඡන්ද දායකයකුටම එකතු වූ ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි අදාළ පීඨය සඳහා ශිෂ්‍ය සංගම් සාමාජිකයසන් පත් කර ගැනීම සඳහා එක් ඡන්දයක්ද, අදාළ පීඨයේ පීඨසභා ශිෂ්‍ය නියෝජිතයන් තෝරා පත් කර ගැනීම සඳහා එක් ඡන්දයක්ද හිමි වේ.

**2016 අංක 01 දරණ සංශෝධනයේ අංක 2.V වගන්තිය පරිදි**

## <u>VI කොටස</u>

## <u>නිලවරණ සම්බන්ධයෙන් නිලවරණ නිලධාරීන්, ශිෂ්‍ය උපදේශකවරුන් සහ උපදේශක කමිටු පත් කිරීම, ක්‍රියාකාරීත්වය සහ රාජකාරී කටයුතු</u>

22. එක් එක් පීඨ ශිෂ්‍ය සංගමය සඳහා වන සාමාජිකයන් පහළොස් **(15)** දෙනා සහ පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයන් දෙදෙනා (02) තෝරා පත් කර ගැනීම පිණිස පැවැත්වෙන නිලවරණය පැවැත්වීමේ අරමුණ සඳහා අවශ්‍ය වන නිලවරණ නිලධාරියා, නියෝජ්‍ය නිලවරණ නිලධාරීන්, තේරීම් භාර නිලධාරියා සහ අනෙකුත් සහකාර නිලවරණ නිලධාරීන්, ප්‍රධාන විධායක නිලධාරියා විසින් පත් කළ යුතු වේ.

23. නිලවරණය පැවැත්වීම පිළිබඳව, නිලවරණ නිලධාරියා, නියෝජ්‍ය නිලවරණ නිලධාරියා, සහකාර නිලවරණ නිලධාරියා සහ තේරීම්භාර නිලධාරියා යන අයට උපදෙස් දීමේ අරමුණ සඳහා වන උපදේශක කමිටුවක් ප්‍රධාන විධායක නිලධාරියා විසින් පත් කළ යුතු වේ.

24. ශිෂ්‍ය සංගම් වර්ෂය අවසන් වීමේ සිට, එක් එක් පීඨ ශිෂ්‍ය සංගමයට සහ විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගමයට සාමාජිකයින් තෝරා ගැනීම නිම කිරීම දක්වා කාල පරිච්ඡේදය අතරතුර උද්ගත වන ඕනෑම ශිෂ්‍ය ගැටළුවක් සම්බන්ධයෙන් ප්‍රධාන ශිෂ්‍ය උපදේශකවරයා සහ එක් එක් පීඨයට අයත් අධ්‍යයන ශිෂ්‍ය උපදේශකවරුන් කටයුතු කළ යුතු වේ.

## VII කොටස
## පීඨ ශිෂ්‍ය සංගමයන්ට සහ පීඨ සභාවල ශිෂ්‍ය නියෝජිත තනතුරු සඳහා නාම යෝජනා

25. **(I)** අට (8) වන වගන්තියේ ප්‍රතිපාදනයන්ට යටත් ව ඕනෑම ලියාපදිංචි සිසුවකු හට, එම පීඨයේ ම ලියාපදිංචි වූ සිසුන් දෙදෙනෙකු විසින් යෝජක සහ ස්ථිරකරු ලෙස අත්සන් කළ නාම යෝජනා පත්‍රයක් මගින් එම පීඨ ශිෂ්‍ය සංගමයේ සාමාජිකයෙකු හෝ පීඨ සභා ශිෂ්‍ය නියෝජිතයෙකු ලෙස තෝරා පත් කර ගැනීම සඳහා ඡන්ද අපේක්ෂකයකු ලෙස නාම යෝජනා ඉදිරිපත් කළ හැකි වේ.

(II) නාම යෝජනා පත්‍රය භාර දෙන අවස්ථාවේ දී, නිලවරණ නිලධාරියා සහ/හෝ සහකාර නිලවරණ නිලධාරියා ඉදිරිපිට දී අපේක්ෂකයා, යෝජකයා හා ස්ථිරකරු නාමයෝජනා පත්‍රයේ අත්සන් තැබිය යුතු වේ.

(II) එවන් නාම යෝජනා පත්‍රයක් පළමුවැනි උපලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුකූලව ම පැවතිය යුතු වේ.

**(IV)** පීඨ ශිෂ්‍ය සංගමයක සාමාජිකයෙකු ලෙස හෝ පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයෙකු ලෙස තේරී පත්වීම සඳහා අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන නාම යෝජනා පත්‍රය, අපේක්ෂකයා විසින් එම නාම යෝජනා පත්‍ර භාර ගන්නා අවසන් දිනය හා වේලාව ලෙසින් දක්වා ඇති දිනයේ හෝ වේලාවේ හෝ ඊට පෙර නිලවරණ නිලධාරියා සහ/හෝ සහකාර නිලවරණ නිලධාරියා වෙත භාර දිය යුතු වේ.

26. (I) 25 වන වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව ඉදිරිපත් නොකළ නාමයෝජනා පත්‍ර නිලවරණ නිලධාරීයා සහ/හෝ සහකාර නිලවරණ නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කළ යුතු වේ.

(II) නාම යෝජනා පත්‍ර භාර ගැනිම අවසන් වන වේලාව දක්වා අපේක්ෂකයෙකුට

ඔහුගේ/ඇයගේ නාම යෝජනා පත්‍රය ඉල්ලා අස් කර ගත හැකි වේ.

27. නිලවරණ නිලධාරියා සහ/හෝ සහකාර නිලවරණ නිලධාරියා වෙත නාම යෝජනා පත්‍රයක් ලැබුණු විට එහි අන්තර්ගත තොරතුරු පරීක්ෂා කොට ඒවායේ නිරවද්‍යතාවය ලිඛිතව සනාථ කරවා ගැනීම සඳහා එහි පිටපතක් ලේඛකාධිකාරී හෝ වැඩ බලන ලේඛකාධිකාරී වෙත ඉදිරිපත් කළ යුතු වේ. මෙම අතුරු ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනවලට අනුකූල නොවන සෑම නාම යෝජනා පත්‍රයක් ම නිලවරණ නිලධාරීයා සහ/හෝ සහකාර නිලවරණ නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කළ යුතු වේ. නාම යෝජනා භාර දීම සඳහා ලබා දී තිබූ අවසන් වේලාවේ සිට පැය48 ඇතුළත නිලවරණ නිළධාරියා සහ/ හෝ සහකාර නිලවරණ නිළධාරියා විසින් භාර ගනු ලැබ සියලු නාම යෝජනා පත්‍ර නාමයෝජනා භාර ගත් ස්ථානයෙන් පිටත ප්‍රදර්ශනය කළ යුතුය. 2016 අංක 01 දරණ සංශෝධනයේ අංක 2.VII වගන්තිය පරිදි

28. (I) යම්කිසි අපේක්ෂකයකුගේ නාම යෝජනා පිළිගැනීමට එරෙහි ව ලියාපදිංචි සිසුවකු විසින්, මතු දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් එක් කරුණක් හෝ පාදක කොට ගෙන යම්කිසි විරෝධතාවක් ඉදිරිපත් කරන්නේ නම්, එම විරෝධතාවය දෙවැනි උපලේඛනයේ ඇති නිර්දේශිත ආකෘතියට අනුව පිළියෙල කොට නිලවරණ නිලධාරියා සහ/හෝ සහකාර නිලවරණ නිලධාරියා වෙත භාරදිය යුතු වේ.

(අ) අපේක්ෂකයා, මෙම අතුරු ව්‍යවස්ථාවේ 3 වන සහ 4 වන කොටස් අනුව නිලවරණයක දී ඡන්දය දීමට හෝ ඡන්ද අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වීමට සුදුස්සෙකු නොවීම.

(ආ) යෝජක සහ/හෝ ස්ථිරකරු විවෘත විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි ශිෂ්‍යයෙකු/ශිෂ්‍යයන් නොවීම.

(ඇ) අපේක්ෂකයා, යෝජක සහ/හෝ ස්ථිරකරු, නිලවරණ නිලධාරියා සහ/ හෝ සහකාර නිලවරණ නිලධාරියා ඉදිරියේ නාම යෝජනා පත්‍රයට ඔහුගේ/ඇයගේ/ඔවුන්ගේ අත්සන් යොදා නොතිබීම.

(ඈ) නාම යෝජනා පත්‍රය, මෙම අතුරු ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන්ට අනුකූල නොවීම.

(II) නාම යෝජනා පත්‍ර ප්‍රසිද්ධියට පත් කළ දිනට පසු දින 12.00 වැනි පැය ඉක්ම යාමට පෙර විනා ඉන් පසුව අපේක්ෂකයෙකුගේ නාමයෝජනා පත්‍රයකට එරෙහිව ලැබෙන විරෝධතා නිලවරණ නිලධාරියා සහ/හෝ සහකාර නිලවරණ නිලධාරියා විසින් සලකා නොබැලිය යුතු වේ.

29. (I) විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා වෙන් කොට තිබූ කාලය ඉකුත්වත් ම, හැකි

තරම් අවම ප්‍රමාදයකින්, නාම යෝජනා පත්‍රයකට එරෙහි ව ඇති සෑම විරෝධතාවයක් ගැන ම තීරණයක් ගෙන, එම තීරණය නාම යෝජනා පත්‍ර භාරගත් ස්ථානයේ පිටත අලවා තැබීමට නිලවරණ නිලධාරියා සහ/හෝ සහකාර නිලවරණ නිලධාරියා විසින් පියවර ගත යුතු වේ.

(II) අවශ්‍ය වෙතොත් නිලවරණ නිලධාරියා සහ/හෝ සහකාර නිලවරණ නිලධාරියා විසින් උපදේශක කමිටුවේ අදහස් ද විමසා බලනු ඇත.

(III) තම තීරණයට හේතු පාදක වූ කරුණු නිලවරණ නිලධාරියා සහ/හෝ සහකාර නිලවරණ නිලධාරියා විසින් විරෝධතා ඉදිරිපත් කළ පුද්ගලයා සහ/හෝ අපේක්ෂකයා වෙත දැන්විය යුතු වේ.

30. (I) ඔහුගේ/ඇයගේ නාම යෝජනා ප්‍රතික්ෂේප කිරීමට නිලවරණ නිලධාරියා සහ/හෝ සහකාර නිලවරණ නිලධාරියා දුන් තීරණයෙන් අතෘප්තියට පත් යම්කිසි අපේක්ෂකයෙකු, එම තීරණය ප්‍රසිද්ධියට පත් කොට පැය 24 ක් ඇතුලත එම තීරණයට එරෙහිව තුන්වැනි උපලේඛනයේ නිර්දේශිත ආකෘති පත්‍රයට අනුව සැකසූ අභියාචනයක් නිලවරණ නිලධාරියා වෙත ඉදිරිපත් කළ හැකි වේ.

(II) තීරණයක් ගැනීම සඳහා, නිලවරණ නිලධාරියා විසින් එම අභියාචනය ප්‍රධාන විධායක නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

(III) ප්‍රධාන විධායක නිලධාරියාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වේ.

31. (I) අපේක්ෂකයකුගේ නාම යෝජනා පත්‍රයට සම්බන්ධ යම්කිසි වරදක් හෝ ඌණතාවයක් හෝ මතු වුවහොත්, නිලවරණ නිලධාරියා සහ/හෝ සහකාර නිලවරණ නිලධාරියා විසින් ඒ පිළිබඳව සටහනක් තබා ගත යුතු අතර, අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ.

32. අභියාචනා පත්‍ර භාරගැනීම අවසන් වූ වෙලාවේ සිට පැය 48 ක් ඇතුළත නිලවරණ නිලධාරියා සහ/හෝ සහකාර නිලවරණ නිලධාරියා විසින් සියළුම වලංගු නාම යෝජනා පත්‍ර පිටපත් කරවා ඒ සියල්ල නාම යෝජනා පත්‍ර භාරගත් ස්ථානයේ පිටත ප්‍රදර්ශනය කරවීමට කටයුතු සැළැස්විය යුතු වේ **2016 අංක 01 දරණ සංශෝධනයේ අංක 2.VIII වගන්තිය පරිදි**

## VIII කොටස

## පීඨ ශිෂ්‍ය සංගමයන්ට හා පීඨ සභාවල ශිෂ්‍ය නියෝජිත තනතුරු සඳහා පත් කර ගැනීමේ නිලවරණය

33. (අ) පීඨ ශිෂ්‍ය සංගමයක් සඳහා සාමාජිකයන් පහලොස් **(15)** දෙනා සහ පීඨ සභාවේ **2016 අංක 01 දරණ සංශෝධනයේ අංක 2.IX වගන්තිය පරිදි**

ශිෂ්‍ය නියෝජිතයන් දෙදෙනා (02) තෝරා පත් කර ගැනීමට ඇති අවස්ථාවක දී, ලැබී ඇති වලංගු නාමයෝජනා පත්‍ර සංඛ්‍යාව අදාල තනතුරු සංඛ්‍යාවට සමාන වන්නේ හා ඉක්මවා නොයන්නේ නම්, එම අපේක්ෂකයන් අදාල පීඨ ශිෂ්‍ය සංගමයේ සාමාජිකයන් සහ/හෝ පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයන් ලෙස යථා පරිදි තේරී පත්වූ බව නිලවරණ නිලධාරී සහ/හෝ සහකාර නිලවරණ නිලධාරියා විසින් ප්‍රකාශයට පත් කළ යුතුය.

(අ) කෙසේ වෙතත් එක් එක් පීඨ ශිෂ්‍ය සංගමය සඳහා සාමාජිකයින් පහළොස් **(15)** දෙනෙකු තෝරා පත් කර ගැනීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ **I** වන කොටසේ **2 (iv)** වගන්තියට අනුකූලව පීඨ ශිෂ්‍ය සංගම් නිළධාරීන් සංඛ්‍යාවට වඩා අඩු නාම යෝජනා පත්‍ර සංඛ්‍යාවක් ලැබී තිබුනේ නම් එවිට අදාළ ශිෂය සංගම් වර්ෂය වෙනුවෙන් පීඨ ශිෂ්‍ය සංගමයක් නොමැති බව නිළවරණ නිළධාරියා විසින් ප්‍රකාශයට පත් කළ යුතුය.

(ආ) පීඨ ශිෂ්‍ය සභාව සඳහා ශිෂ්‍ය නියෝජිතයන් තෝරා පත් කර ගැනීම සඳහා වලංගු නාම යෝජනා පත්‍ර ලැබී නොමැති නම් අදාළ පීඨය සඳහා එම ශිෂ්‍ය සංගම් වර්ෂය වෙනුවෙන් ශිෂ්‍ය නියෝජිතයන් නොමැති බව නිළවරණ නිළධාරියා විසින් ප්‍රකාශයට පත් කළ යුතුය.

**2016 අංක 01 දරණ සංශෝධනයේ අංක 2.X වගන්තිය පරිදි**

34. එක් එක් පීඨ ශිෂ්‍ය සංගමයක් සඳහා සාමාජිකයන් පහළොස් **(15)** දෙනා සහ පීඨ සභා ශිෂ්‍ය නියෝජිතයන් දෙදෙනා (02) තෝරා පත් කර ගැනීමට ඇති අවස්ථාවක දී, ලැබී ඇති වලංගු නාමයෝජනා පත්‍ර සංඛ්‍යාව අදාල තනතුරු සංඛ්‍යාව ඉක්මවා යන්නේ නම්, ඡන්දය භාවිත කර පීඨ ශිෂ්‍ය සංගමයක සාමාජිකයන් පහළොස් **(15)** දෙනා සහ එක් එක් පීඨයක පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයන් දෙදෙනා (02) තෝරා පත් කර ගැනීම පිණිස නිලවරණයක දී ඡන්දය භාවිතා කිරීමට දිනයක්/දින නියම කර ගැනිම ප්‍රධාන විධායක නිළධාරියා විසින් සිදු කළ යුතු වේ.

35. නාම යෝජනා පත්‍ර භාර ගැනීම අවසන් වූ දිනයත්, ඡන්දය භාවිත කරන දිනය හෝ දින අතර කාල පරිච්ඡේදය දින 21 කට අඩු නොවිය යුතු අතර, දින 45 කට වැඩි නොවිය යුතු වේ. එසේ වුව ද, පවත්නා තත්ත්වයේ අවශ්‍යතාවයන් මත, එම දින සහ මධ්‍යස්ථාන වෙනස් කළ යුතු යැයි ප්‍රධාන විධායක නිලධාරියාට ඒත්තු ගියහොත්, ඔහු/ඇය විසින් එම දින සහ මධ්‍යස්ථාන වෙනස් කළ හැකි ය.

36. නාමයෝජනා පත්‍ර භාරගනු ලැබූ අපේක්ෂකයන්ගේ නම් සහ නිලවරණ නිළධාරියා සහ/හෝ නියෝජ්‍ය නිලවරණ නිළධාරියා විසින් ඉල්ලා තිබූ පරිදි ඔවුන්ගේ ජීවදත්ත තොරතුරු සහ පණිවුඩ එම නිළධාරියා වෙත ලැබී ඇත්නම් ඒවා ද විශ්වවිද්‍යාල තුළ සහ විශ්වවිද්‍යාලයීය වෙබ් පිටුවෙහි පළකරවාලීමට නිලවරණ නිළධාරියා සහ/හෝ සහකාර

නිලවරණ නිලධාරියා විසින් පියවර ගත යුතු වේ.

37. එවන් පීඨ ශිෂ්‍ය සංගම් සඳහා සාමාජිකයන් පහළොස් **(15)** දෙනා බැගින් සහ පීඨ සභා නියෝජිතයන් දෙදෙනෙකු (02) බැගින් තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම නිලවරණ නිලධාරියා සහ/හෝ සහකාර නිලවරණ නිලධාරියා විසින් රහස් ඡන්දයක් ලෙස පැවැත්විය යුතු වේ. එවැනි ඡන්ද විමසීමකදී ප්‍රයෝජනයකට ගත යුතු ඡන්ද පත්‍රිකා සිවුවැනි උපලේඛණයේ නිර්දේශිත පරිදි සකස් කළ යුතු වේ.

38. **(I)** පීඨ ශිෂ්‍ය සංගමයක් සඳහා හෝ පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිත තනතුරු සඳහා සෑම අපේක්ෂකයෙකුටම, නිලවරණ මධ්‍යස්ථානයේ දි, ඡන්ද ගණන් කරනු ලබන විට තමන් නියෝජනය කිරීම සඳහා එම පීඨයේ ම ලියාපදිංචි වූ, ඡන්දය පාවිච්චි කිරීමට සුදුසුකම් සපුරාලන ලියාපදිංචි ශිෂ්‍යයෙකු ගණන් කිරීමේ නියෝජිතයෙකු ලෙස පත් කළ හැකි වේ.

**(II)** මෙවන් පත්වීමක් ලබන සෑම ශිෂ්‍යයෙකුගේම නම සහ ලියාපදිංචි අංකය ඇතුළත් ලිඛිත දැන්වීමක් ඡන්දය නිමාවීමට පැය (48) කට පෙර ඡන්ද අපේක්ෂකයා විසින් නිලවරණ නිලධාරියා සහ/ හෝ සහකාර නිලවරණනිලධාරියා වෙත ලබා දිය යුතු වේ.

**(III)** එවන් දැන්වීමක්, නිර්දේශිත කාලය තුළ ලබා නොදෙන කිසිදු අපේක්ෂකයෙකුට ඡන්දය ගණන් කරන අවස්ථාවේ දී ගණන් කිරීමේ නියෝජිතයෙකු යෙදවීමට අවසර නොලැබේ.

39. නිලවරණයේ කාලසීමාව සති අන්ත දෙකක් අන්තර්ගත වන අනුක්‍රමික දින නවයක කාලයක් විය යුතු වේ.

40. නිලවරණය අවසානයේ ඡන්ද පත්‍රිකා ගණන් කිරීම සහ එම ගණන් කිරීමේ ප්‍රතිඵල නිලවරණ නිලධාරියා සහ/හෝ සහකාර නිලවරණ නිලධාරියා වෙත දැනුම් දීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ භාරකාර නිලධාරියා වග කිව යුතු ය.

41. (I) නිලවරණයේ ප්‍රතිඵල ලැබීමෙන් පසු, පහත දැක්වෙන යටත් ව, පීඨ ශිෂ්‍ය සංගමයට තෝරා ගැනීමේ ඡන්ද ප්‍රතිඵල, නිලවරණ නිලධාරියා සහ/හෝ සහකාර නිලවරණ නිලධාරියා විසින් ප්‍රකාශයට පත් කළ යුතු වේ.

(අ) අදාළ ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ කාන්තා ඡන්ද අපේක්ෂකයින් ලබා ඇති ඡන්දවල ප්‍රතිශතය ගණනය කරනු ලබන අතර සියලුම

**2016 අංක 01 දරණ සංශෝධනයේ අංක 2.XI වගන්තිය පරිදි**

ප්‍රාදේශීය මධ්‍යස්ථාන වලින් ඉහළම ප්‍රතිශතය ලබා ඇති කාන්තා ඡන්ද අපේක්ෂකයින් 04 දෙනා මගින් 2( iii) වගන්තියේ දක්වා ඇති කාන්තා සාමාජිකයින් වෙනුවෙන් වෙන් කර ඇති ස්ථාන 4 සඳහා පත් කරනු ලැබේ.

(ආ) ඉහත (අ) ඡේදයේ දක්වා ඇති පරිදි තෝරා පත් කර ගන්නා ලද කාන්තා ඡන්ද අපේක්ෂකයින් 04 දෙනා අදාළ ප්‍රාදේශීය මධ්‍යස්ථානය නියෝජනය කරන එක් නියෝජිතයකු හෝ නියෝජිතයන් සංඛ්‍යාවට ඇතුළත් විය යුතුය. **2016 අංක 01 දරණ සංශෝධනයේ අංක 2.XI වගන්තිය පරිදි**

(ඇ) කාන්තා අපේක්ෂකයින් වෙනුවෙන් වෙන් කර ඇති ස්ථාව එකක් හෝ කීපයක් ඉහත දක්වා ඇති ප්‍රතිපාදන ප්‍රකාරව පිරවිය නොහැකි වුවහොත් එම තනතුරු පුරප්පාඩු තනතුරු ලෙස සළකනු ලැබේ. **2016 අංක 01 දරණ සංශෝධනයේ අංක 2.XI වගන්තිය පරිදි**

(ඈ) 20 වන වගන්තියේ ප්‍රතිපාදන අනුව එක් මධ්‍යස්ථානයේ අදාල පීඨය සඳහා වූ ඡන්ද සංඛ්‍යාවෙන් වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබා ගන්නා

අපේක්ෂකයන් පීඨ ශිෂ්‍ය සංගමයට තෝරා පත් කර ගන්නා ලද බව ප්‍රකාශයට පත් කළ යුතු ය. **2016 අංක 01 දරණ සංශෝධනයේ අංක 2.XI හා 2.XII වගන්තිය පරිදි**

(ඉ) ඉතිරි අපේක්ෂකයන් ඔවුන් ලබාගත් ඡන්ද සංඛ්‍යාවේ අනුපිළිවෙලට ලැයිස්තු ගත කළ යුතු අතර එක් එක් ප්‍රදේශිය මධ්‍යස්ථානය වෙනුවෙන් නිරීක්ෂණ සංචිතයක් සැකසිය යුතු වේ. **2016 අංක 01 දරණ සංශෝධනයේ අංක 2.XI වගන්තිය පරිදි**

**(II)** පීඨ ශිෂ්‍ය සංගමයක සාමාජිකයන් තෝරාපත් කරගැනිම සඳහා වන නිලවරණයේදී අපේක්ෂකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හෝ ලබාගත් ඡන්ද සංඛ්‍යාව සමාන වන කල්හි එක් ඡන්දයක් එකතු කිරීමෙන් එක් අපේක්ෂකයකුට සාමාජිකයකු ලෙස තේරී පත් වීමේ හැකියාව ලැබේ. මෙම අතිරේක ඡන්දය එකතු කළ යුත්තේ කවුරුන් හට ද යන්න කුසපත් ඇදීමක් මඟින් තීරණය කළ යුතු වේ.

**(III)** ඉහත දැක්වෙන (1) සහ (11) ඡේදයන්හි නියමයන්ට අනුව ලැයිස්තුගත කරන ලද අපේක්ෂකයන් පහළොස් **(15)** දෙනා පීඨ ශිෂ්‍ය සංගමයේ සාමජිකයන් වශයෙන් යථා පරිදි තෝරාගනු ලැබූ සාමාජිකයන් ලෙස ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතු වේ.

42. (I) නිලවරණයේ ප්‍රතිඵල ලැබීමෙන් පසුව පහත දැක්වෙන ප්‍රතිපාදනයන්ට යටත් ව, පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයන් පත් කර ගැනීමේ ඡන්ද

ප්‍රතිඵල නිලවරණ නිලධාරියා සහ/ හෝ සහකාර නිලවරණ නිලධාරියා විසින් ප්‍රකාශයට පත් කළ යුතු වේ.

(අ) අපේක්ෂකයන් අතරින් වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබා ගන්නා අපේක්ෂකයන් දෙදෙනා, තමන් විසින් නාම යෝජනා ඉදිරිපත් කළ අදාල පීඨයේ, පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයන් ලෙස නිසි පරිදි තෝරා පත් කර ගත් බව ප්‍රකාශයට පත් කළ යුතු වේ.

(ආ) පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයන් පත් කර ගන්නා නිලවරණයේදී අපේක්ෂකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හෝ ලබාගත් ඡන්ද සංඛ්‍යාව සමාන වන කල්හි ඔවුන් අතුරින් එක් අයෙකුට එක් ඡන්දයක් එකතු කිරීමෙන් එක් අපේක්ෂකයකුට එම පීඨයේ පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයකු වීමේ හැකියාව ලැබේ. මෙම අතිරේක ඡන්දය එකතු කළ යුත්තේ කවුරුන් හට ද යන්න කුසපත් ඇදීමක් මඟින් තීරණය කළ යුතු වේ.

43. නිලවරණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කොට දින 14 ක් ඉක්ම ගිය පසු නිලවරණ නිලධාරියා සහ/හෝ සහකාර නිලවරණ නිලධාරියා විසින් ප්‍රධාන විධායක නිලධාරියා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ.

## IX කොටස

## පීඨ ශිෂ්‍ය සංගමයේ නිලධාරීන් තෝරා පත් කර ගැනිම, පීඨ ශිෂ්‍ය සංගමයේ සමාජිකයන්ගේ හා පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයන්ගේ ධූර කාලය

44. **(I)** ප්‍රධාන විධායක නිලධාරියා විසින් පීඨ ශිෂ්‍ය සංගමයේ ප්‍රථම රැස්වීම සදහා දින නියම කළ යුතු අතර, මෙහිදි සාමාජිකයන් විසින් එම සංගමය සඳහා නිලධාරි මණ්ඩලයක් තෝරාපත් කර ගත යුතු වේ. එම දිනය, මෙම අතුරු ව්‍යවස්ථාවේ 41 වන වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුව, පීඨ ශිෂ්‍ය සංගමයට සාමාජිකයන් පහළොස් **(15)** දෙනෙකු තෝරාගැනීමෙන් පසු එළඹෙන දෙසතිය තුළ විය යුතු වේ.

**(II)** නිලවරණ නිළධාරියා සහ/ හෝ සහකාර නිලවරණ නිලධාරියා විසින් පීඨ ශිෂ්‍ය සංගමයේ ප්‍රථම රැස්වීමේ මුලසුන දැරිය යුතු අතර සභාවේ ගරුත්වය ආරක්ෂා කර ගනිමින් නිලවරණය සාමකාමීව පවැත්වීමට අවශය සියලු පියවර ගත යුතු ය.

45. පීඨ ශිෂ්‍ය සංගමයේ නිලධාරි මණ්ඩලය තෝරා පත් කර ගැනීම අවසානයේ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා විසින් විශ්වවිද්‍යාලයීය ආචාර්යවරයෙකු පීඨ ශිෂ්‍ය සංගමයේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික ලෙස පත් කළ යුතු වේ.

46. ශිෂ්‍ය සංගම් වර්ෂයේ සෑම මාසයක් පාසාම යටත් පිරිසෙන් එක් රැස්වීමක් හෝ පීඨ ශිෂ්‍ය සංගමය විසින් පැවැත්විය යුතු වේ. එවන් රැස්වීමක ගණපූරණය විය යුත්තේ සාමාජිකයන් පස්දෙනෙකි.

47

(I) පීඨ ශිෂ්‍ය සංගමයක එක් එක් නිලධරයකුගේ සහ අනෙකුත් සාමාජිකයන්ගේ ධුර කාලය ඒ සඳහා ඔහු/ඇය තෝරා පත්කර ගනු ලැබූ ශිෂ්‍ය සංගම් වර්ෂය අවසානයේ දී අහෝසි වේ.

**(II)** පීඨ ශිෂ්‍ය සංගමයක කිසිම නිලධාරියකුට, එක් ශිෂ්‍ය සංගම් වර්ෂයකට වඩා එම තනතුර දැරිය නොහැක.

**(III)** යම්කිසි නිලධාරියෙකු හෝ වෙනත් සාමාජිකයකු හෝ

(අ) ලියාපදිංචි ශිෂ්‍ය භාවය අහෝසි වූ විට, හෝ

(ආ) සිය අත්සනින් යුත් ලිපියක් ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික මගින් ප්‍රධාන විධායක නිලධාරියා වෙත එවා සිය තනතුරින් ඉල්ලා අස්වූ විට, හෝ

(ඇ) ශිෂ්‍යභාවය අත්හිටුවීමකට ලක්වූ විට හෝ විශ්වවිද්‍යාලයෙන් නෙරපනු ලැබූ විටක, හෝ

(ඈ) නොපැමිණීම ගැන සාධාරණ හේතුන් නොදක්වා පිට පිට සභා රැස්වීම් තුනකට නොපැමිණීම නිසා හෝ අවස්ථාවෝචිත පරිදි ඔහු තම නිලය හෝ සාමාජිකත්වය හෝ අත්හැර ගියා සේ සැලකිය යුතු වේ.

**(IV)** යම්කිසි ප්‍රාදේශිය මධ්‍යස්ථානයකට සම්බන්ධ සාමාජිකයකු එම ප්‍රාදේශිය මධ්‍යස්ථානයට ඇති සම්බන්ධය අවසන් කළහොත්, ඔහු විසින් එම ප්‍රාදේශිය මධ්‍යස්ථානය නියෝජනය කිරීමද අවසන් විය යුතු ය.

48. පීඨ ශිෂ්‍ය සංගමයක හෝ පීඨ සභාවක ශිෂය නියෝජිත තනතුරක් සම්බන්ධව යම්කිසි පුරප්පාඩුවක් ඇතිවුවහොත් එම පුරප්පාඩුව පහත දැක්වෙන නියමයන්ට අනුකූල වන අයුරින් පිරවිය යුතු වේ.

**(I)** පීඨ ශිෂය සංගමයේ යම්කිසි ධුරයක් සඳහා පුරප්පාඩුවක් ඇතිවූ අවස්ථාවකදී ඉතිරි නිලධාරීන් හා අනෙකුත් සාමාජිකයන් විසින් පීඨ ශිෂ්‍ය සංගමයේ රැස්වීමක දී එම ධුරය සඳහා කෙනෙකු තමන් අතුරින් ම තෝරාපත් කර ගත යුතු වේ.

**(II)** යම්කිසි ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් නියෝජනය කරන සාමාජිකයෙකු සඳහා පුරප්පාඩුවක් ඇති වූ විටක එම ප්‍රාදේශීය මධ්‍යස්ථානය නියෝජනය කරන්නන් අතුරින් ඊළඟ වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබාගත්, නිරීක්ෂණ සංචිතය තුල සිටින අපේක්ෂකයා එම පුරප්පාඩුව පිරවීම සඳහා පත් කළ යුතු ය.

**(III)** පීඨ සභාවක ශිෂ්‍ය නියෝජිත තනතුරක් සම්බන්ධව යම් පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක දී, එම පීඨය නියෝජනය කරමින් පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයකු ලෙස ඊළඟ වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත් අපේක්ෂකයා එම පුරප්පාඩුව පිරවීම සඳහා පත් කළ යුතු ය.

**(IV)** මෙම වගන්තියේ ඉහත සඳහන් නියමයන්ට අනුව පුරප්පාඩුවක් පිරවීම සඳහා පත්කරනු ලබන කවර අපේක්ෂකයෙක් වුව ද ඊට කලින් එම ධූරය දැරූ අපේක්ෂකයා සඳහා ශේෂ වී ඇති කාලසීමාව සඳහා පමණක් එම ධූරය දැරීය යුතු වේ.

## X කොටස

## පීඨ ශිෂ්‍ය සංගමයේ නිලධාරීන්ගේ රාජකාරී වගකීම් සහ කාර්යයන්

49. (I) පීඨ ශිෂ්‍ය සංගමයක සභාපතිගේ රාජකාරී කටයුතු සහ කාර්යයන් විය යුත්තේ,

(අ) පීඨ ශිෂ්‍ය සංගමයේ රැස්වීම් කැඳවීම, සහ

(ආ) පීඨ ශිෂ්‍ය සංගමයේ සියලු රැස්වීම්වල මුලසුන දැරීම, සහ

(ඇ) පීඨ ශිෂ්‍ය සංගමය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම

**(II)** පීඨ ශිෂ්‍ය සංගමයක උප සභාපතිගේ රාජකාරී කටයුතු සහ කාර්යයන් විය යුත්තේ,

(අ) පීඨ ශිෂ්‍ය සංගමයේ සභාපති නොපැමිණි ඕනෑම අවස්ථාවකදී පීඨ ශිෂ්‍ය සංගමයේ රැස්වීම්වල මුලසුන දැරීම, සහ

(ආ) සිය රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා සභාපතිට සහය ලබා දීම, සහ

(ඇ) පීඨ ශිෂ්‍ය සංගමය මගින් ඔහු/ඇය වෙත පවරනු ලබන ඕනෑම රාජකාරී කටයුත්තක් හෝ කාර්යයක් හෝ ඉටු කිරීම.

**(III)** පීඨ ශිෂ්‍ය සංගමයක ලේකම්ගේ රාජකාරී කටයුතු සහ කාර්යයන් විය යුත්තේ,

(අ) පීඨ ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරකම් පිළිබඳ සියලුම වාර්තා තබා ගැනීම.

(ආ) සභාපතිගේ උපදෙස් මත හෝ පීඨ ශිෂ්‍ය සංගමයේ සම්පූර්ණ සාමාජිකත්වයෙන් 1/3 කට නොඅඩු සංඛ්‍යාවකගේ ලිඛිත ඉල්ලීමක් ලේකම් වෙත ලැබුණු විට හෝ පීඨ ශිෂ්‍ය සංගමයේ රැස්වීම කැඳවීම.

(ඇ) ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකගේ හෝ පීඨයේ ඕනෑම ශිෂ්‍යයෙකුගේ පරීක්ෂාව සඳහා රැස්වීම් වාර්තා ලබා දීමට සහතික වීම

**(IV)** පීඨ ශිෂ්‍ය සංගමයක සංස්කාරකගේ රාජකාරී කටයුතු සහ කාර්යයන් විය යුත්තේ,

(අ) පීඨ ශිෂ්‍ය සංගමය විසින් තීරණය කරනු ලබන දැනුවත් කිරීමේ/ ප්‍රචාරක ක්‍රියාවලීන් සංවිධානය කිරීම

(ආ) පීඨ ශිෂ්‍ය සංගමය මගින් ඔහු/ඇය වෙත පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරී කටයුත්තක් හෝ කාර්යයක් හෝ ඉටු කිරීම.

**(V)** පීඨ ශිෂ්‍ය සංගමයක කණිෂ්ට භාණ්ඩාගාරිකගේ රාජකාරී කටයුතු සහ කාර්යයන් විය යුත්තේ,

(අ) පීඨ ශිෂ්‍ය සංගමයේ අරමුදල් තම භාරයේ තබා ගෙන පවත්වා ගෙන යාම

(ආ) ගිණුම් පවත්වාගෙන යාම සඳහා වන යම්කිසි රෙගුලාසි වෙතොත් ගිණුම් පවත්වාගෙන යාම සඳහා වන යම්කිසි රෙගුලාසි වෙතොත් ඒවාට යටත්ව සියළු ආදයම් සහ වියදම් ඒ සඳහාම වන ගිණුම් පොත් වල ක්‍රමාණුකූලව වාර්තා කොට තැබීම සහ ගිණුම්ගත කිරීම කෙරෙන බව සහතික කිරීම.

(ඇ) පීඨ ශිෂ්‍ය සංගමයට ලැබෙන කවර මුදලක් සම්බන්දයෙන් වුව ද සතියක් ඇතුළත ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වෙත දැනුම් දීම.

(ඈ) ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකගේ අනුමැතිය ඇතිව පීඨ ශිෂ්‍ය සංගමයට අයත් අරමුදල් වලින් ගෙවීම් සිදු කිරීම.

(ඉ) පීඨ ශිෂ්‍ය සංගමයේ නිලධාරී මඩුල්ල තෝරාපත් කරගත් දිනයේ

සිට මසක් ඇතුලත, එම නිලධාරී මඩුල්ලේද අදහස් විමසීමෙන් සිට මසක් ඇතුලත, එම නිලධාරී මඩුල්ලේද අදහස් විමසීමෙන් කිරීම.

(ඊ) අවශ්‍ය වු විටක පරිපුරක ඇස්තමේන්තු පිළියෙල කිරීම.

(උ) එක් එක් කාර්තුවේ අවසාන දිනයේ දී සංගමයේ මුල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවක් එම කාර්තුවේ අවසන් දින සිට මසක් ඇතුලත පීඨ ශිෂ්‍ය සංගමය සහ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වෙත ඉදිරිපත් පීඨ ශිෂ්‍ය සංගමය සහ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වෙත ඉදිරිපත් කිරීම සහ,

(ඌ) පීඨ ශිෂ්‍ය සංගමය තෝරාපත් කර ගනු ලැබු ශිෂ්‍ය සංගම් වර්ෂය ඉකුත් වී දෙසතියක් ඇතුලත, ශිෂ්‍ය සංගම් වර්ෂය සඳහා පීඨ ශිෂ්‍ය සංගමයේ ආදයම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශයක් සහ ශේෂ පත්‍රයත්, ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික මගින්, ප්‍රධාන විධායක නිලධාරීයා විසින් පත් කරන ලද විගණන නිලධාරියා වෙත ඉදිරිපත් කිරීම.

50. (I) පීඨ ශිෂ්‍ය සංගමයේ නිලධාරී මණ්ඩලය වෙත, පහත සඳහන් කරුණු කරුණු පිළිබඳ ව පුර්ණ දැනුවත් කිරීමක් ලබා දිය යුතු වේ.

(අ) සංශෝධිත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත මගින් නියම කර ඇති අන්දමට ඔවුන්ගේ රාජකාරී කටයුතු සහ වගකීම්.

(ආ) විශ්වවිද්‍යාලය මගින් ශිෂ්‍ය සංගමයට වෙන්කොට දී ඇති අරමුදල් කළමණාකරණය සහ වියදම් කිරීම.

**(II)** පීඨ ශිෂ්‍ය සංගමය සැකසීමේ කාර්යය සඳහා තේරීම් භාර නිලධාරියා විසින් කැඳවනු ලබන රැස්වීමේ දී, ප්‍රධාන ශිෂ්‍ය උපදේශක, සියලු අධ්‍යයන ශිෂ්‍ය උපදේශකවරුන් සහ පීඨ ශිෂ්‍ය සංගම් වල ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකවරුන් විසින් ඉහත දැක්වෙන (අ) සහ (ආ) පිළිබඳ ව එහි නිලධාරී මණ්ඩලය දැනුවත් කරනු කළ යුතු වේ.

**(III)** 49 **(V)** වගන්තිය යටතේ දක්වා ඇති රාජකාරී කටයුතු සහ කාර්යයන් සපුරාලීමේ දී කනිෂ්ට භාණ්ඩාගාරික විසින් ගනු ලබන සියලුම තීරණ හා ක්‍රියාවන් සම්බන්ධයෙන් පීඨ ශිෂ්‍ය සංගමයේ සාමාජිකයන් තනි තනිව හා සාමුහිකව වගකීමට බැඳේ.

## XI කොටස

## විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමය

51. (I) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමය, විශ්ව විද්‍යාලයේ සෑම මධ්‍යස්ථානයක ම ලියාපදිංචි සියලුම උපාධි අපේක්ෂක ශිෂ්‍ය ප්‍රජාවෙහි නියෝජිතයා විය යුතු වේ.

(II) පිහිටුවන ලද එක් එක් පීඨ ශිෂ්‍ය සංගමයේ සියඑම සාමාජිකයන් සහ තෝරා පත් කර ගන්නා ලද සියඵ පීඨ සංගම් ශිෂ්‍ය නියෝජිතවරුන්ගෙන් විවෘත විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගමය සංයුක්ත විය යුතු වේ.

**2016 අංක 01 දරණ සංශෝධනයේ අංක 2.XIII වගන්තිය පරිදි**

52. (I) විශ්ව විද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා විසින්, විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගමයේ ප්‍රථම රැස්වීම සඳහා දිනයක් නියම කළ යුතු අතර, එහි දී, විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ සාමජිකයින් විසින් මතු දැක්වෙන නිලධාරී මඩුල්ල තෝරා පත් කර ගත යුතු වේ.

(අ) සභාපති
(ආ) උප සභාපති
(ඇ) ලේකම්
(ඈ) සංස්කාරක
(ඉ) කනිෂ්ට භාණ්ඩාගාරික

(II) එම දිනය, මෙම අතුරු ව්‍යවස්ථාවේ 41 වන වගන්තිය ප්‍රකාරව පීඨ ශිෂ්‍ය සංගමයන්හි සාමාජිකයින් **පහළොස් (15)** දෙනා සහ පීඨ සභාවන්හි ශිෂ්‍ය නියෝජිතයින් දෙදෙනා (2) තෝරා පත් කර ගැනීමේ දින සිට සති හතරක (04)ක කාලයක් තුළ දිනයක් විය යුතු වේ.

(III) මෙම රැස්වීම පැවැත්වීමේ කාර්යය උදෙසා, රහස් ඡන්දයෙන් නිලධාරී මඩුල්ල තෝරා ගැනීම පිණිස, විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා විසින් විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු තේරීම්භාර නිලධාරියා ලෙස පත් කළ යුතු වේ. තේරීම්භාර නිලධාරියා මෙම රැස්වීමෙහි මුලසුන දැරිය යුතු අතර සභාවේ ගරුත්වය ආරක්ෂා කර ගනිමින් නිලවරණය සාමකාමීව පැවැත්වීම සහතික කිරීම පිණිස අවශය සියළු පියවර ඔහු විසින් ගත යුතු ය.

(IV) නිලධාරී මණ්ඩලය තෝරා පත් කර ගැනීම අවසන් වූ පසු, විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා විසින් ආචාර්යවරයෙකු විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික ලෙස පත් කළ යුතු වේ.

**(V)** තේරීම්භාර නිලධාරියා විසින් ඉහත නිලවරණය පිළිබඳව වාර්තාවක්, ප්‍රධාන විධායක නිලධාරියා වෙත භාර දිය යුතු වේ.

(VI) ශිෂ්‍ය සංගම් වර්ෂයේ එක් එක් මාසයන්හි යටත් පිරිසෙන් එක් රැස්වීමක්වත් විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමය විසින් පැවැත්විය යුතු වේ. එවන් රැස්වීමක ගණපූරණය වන්නේ සමස්ත සාමාජිකයන් සංඛ්‍යාවෙන් 1/3 ප්‍රමාණයකි.

53. (I) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ සෑම නිලධාරියෙකුගේ ම ධූර කාලය ඒ සඳහා ඔහු/ඇය තෝරා පත්කර ගනු ලැබූ ශිෂ්‍ය සංගම් වර්ෂය අවසානයේ දී අහෝසි විය යුතු වේ.

**(II)** විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ කිසිම නිලධාරියකුට, එක් ශිෂ්‍ය සංගම් වර්ෂයක් ඉක්මවා එම ධූරයේ ම රැඳී සිටීමට හැකි නොවිය යුතු ය.

**(III)** යම් කිසි නිලධාරියෙකු

(අ) පීඨ ශිෂ්‍ය සංගමයක සාමාජිකභාවය හෝ නිලධාරී තනතුර අහෝසි වූ විට, හෝ

(ආ) සිය අත්සනින් යුත් ලිපියක් ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික මගින් ප්‍රධාන විධායක නිලධාරියා වෙත එවා සිය තනතුරින් ඉල්ලා අස් වූ විට, හෝ

(ඇ) නොපැමිණීම ගැන සාධාරණ හේතුන් නොදක්වා පිට පිට සභා රැස්වීම් තුනකට නොපැමිණීම නිසා හෝ

අවස්ථාවෝචිත පරිදි ඔහු තම නිලය හෝ සාමාජිකත්වය අත්හැර ගියා සේ සැළකිය යුතු වේ

**(IV)** ඉහත **(III)** වගන්තිය යටතේ ඇති වන ඕනෑම පුරප්පාඩුවක් 52 වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව පිරවිය යුතු වේ. කෙසේ වෙතත්, පීඨ ශිෂ්‍ය සංගමයක පුරප්පාඩුවක් ඇති වීමේ හේතුවක් මත, විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ නිලධාරී මඬුල්ලේ පුරප්පාඩුවක් ඇති වූයේ නම්, විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගමයේ නිලධාරී මඬුල්ලේ පුරප්පාඩුව පිරවීම සඳහා නිලවරණයක් පැවැත්විය යුත්තේ පීඨ ශිෂ්‍ය සංගමයේ පුරප්පාඩුව පිරවීමෙන් පසුව විය යුතු ය.

54 **(I)** විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ සභාපතිගේ රාජකාරී කටයුතු සහ කාර්යයන් විය යුත්තේ,

(අ) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ රැස්වීම් කැඳවීම;

(ආ) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ සියළු රැස්වීම්වල මුලසුන දැරීම

සහ

(ඇ) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම.

**(II)** විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ උප සභාපතිගේ රාජකාරී කටයුතු සහ කාර්යයන් විය යුත්තේ,

(අ) සභාපති නොපැමිණි ඕනෑම අවස්ථාවක දී විශ්ව විද්‍යාල ශිෂ්‍ය සංගමයේ රැස්වීම්වල මුලසුන දැරීම;

(ආ) ඔහුගේ/ඇයගේ රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා සභාපතිට සහාය ලබා දීම; සහ

(ඇ) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමය මගින් ඔහු/ඇය වෙත පවරනු ලබන ඕනෑම රාජකාරී කටයුත්තක් හෝ කාර්යයක් හෝ ඉටු කිරීම.

**(III)** විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ ලේකම්ගේ රාජකාරී කටයුතු සහ කාර්යයන් විය යුත්තේ,

(අ) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරකම් පිළිබඳ සියලුම වාර්තා තබා ගැනීම; සහ

(ආ) සභාපතිගේ උපදෙස් මත හෝ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ සම්පූර්ණ සාමාජිකත්වයෙන් 1/3 කට නොඅඩු සංඛ්‍යාවකගේ ලිඛිත ඉල්ලීමක් ලේකම් වෙත ලැබුණු විට විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ රැස්වීම් කැඳවීම සහ

(ඇ) ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකගේ හෝ පීඨයේ ඕනෑම ශිෂ්‍යයෙකුගේ පරීක්ෂාව සඳහා රැස්වීම් වාර්තා ලබා දීමට සහතික වීම

(IV) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ සංස්කාරකගේ රාජකාරී කටයුතු සහ කාර්යයන් විය යුත්තේ,

(අ) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමය විසින් තීරණය කරනු ලබන දැනුවත් කිරීමේ/ප්‍රචාරක ක්‍රියාවලීන් සංවිධානය කිරීම; සහ

(ආ) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමය මගින් ඔහු/ඇය වෙත පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරී කටයුත්තක් හෝ කාර්යයක් හෝ ඉටු කිරීම.

(V) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ කනිෂ්ට භාණ්ඩාගාරිකගේ රාජකාරී කටයුතු සහ කාර්යයන් විය යුත්තේ,

(අ) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ අරමුදල් තම භාරයේ තබා ගෙන පවත්වා ගෙන යාම;

(ආ) ගිණුම් පවත්වාගෙන යාම සඳහා වන යම්කිසි රෙගුලාසි වෙතොත් ඒවාට යටත්ව සියළු ආදායම් සහ වියදම් ඒ සඳහාම වන ගිණුම් පොත් වල ක්‍රමාණුකූලව වාර්තා කොට තැබීම සහ ගිණුම්ගත කිරීම කෙරෙන බව සහතික කිරීම;

(ඇ) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයට ලැබෙන කවර මුදලක් සම්බන්දයෙන් වුව ද සතියක් ඇතුළත ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වෙත දැනුම් දීම;

(ඈ) ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකගේ අනුමැතිය ඇති ව විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයට අයත් අරමුදල් වලින් ගෙවීම් සිදු කරනු ලැබීම;

(ඉ) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ නිලධාරී මඩුල්ල තෝරාපත් කරගත් දිනයේ සිට මසක් ඇතුලත, එම නිලධාරී මඩුල්ලේද අදහස් විමසීමෙන් පසුව ශිෂ්‍ය සංගම් වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළිලෙ කිරීම;

(ඊ) අවශ්‍ය වු විටක පරිපුරක ඇස්තමේන්තු පිළියෙල කිරීම;

(උ) එක් එක් කාර්තුවේ අවසාන දිනයේ දී සංගමයේ මුල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවක් එම කාර්තුවේ අවසන් දින සිට මසක් ඇතුලත විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමය වෙත ඉදිරිපත් කිරීම; සහ

(ඌ) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමය තෝරාපත් කර ගනු ලැබු ශිෂ්‍ය සංගම් වර්ෂය ඉකුත් වී දෙසතියක් ඇතුලත ශිෂ්‍ය සංගම් වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශයක් සහ ශේෂ පත්‍රයත්, ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික මගින් ප්‍රධාන විධායක නිලධාරීයා විසින් පත් කරන ලද විගණන නිලධාරියා වෙත ඉදිරිපත් කිරීම.

55 මෙම අතුරු ව්‍යවස්ථාවේ 54 **(V)** වගන්තිය යටතේ දක්වා ඇති රාජකාරී කටයුතු සහ කාර්යයන් ඉටු කිරීමේ දී කනිෂ්ට භාණ්ඩාගාරික විසින් ගනු ලබන සියලුම තීරණ හා ක්‍රියාවන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ සාමාජිකයන් තනි තනිව හා සාමූහික ව වගකීමට බැඳේ.

56. 49 (V) සහ 54 (V) වගන්තීන් හි දැක්වෙන පරිදි පීඨ ශිෂ්‍ය සංගමයක හෝ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ යම් සාමාජිකයෙක්/සාමාජිකයන්, ඔහුගේ/ ඇයගේ/ඔවුන්ගේ මූල්‍යමය වගකීම් ඉටු කිරීමට අසමත් වන්නේ නම්, එවැනි අසමත් වීමක් පිළිබඳ ව විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය විනය සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව යටතේ ක්‍රියා කළ යුතු වේ.

57. මෙම අනු නීතිවල අර්ථ නිරූපණය සම්බන්ධ ඕනෑම ගැටලුවක් විශ්ව විද්‍යාලයේ පාලක සභාව වෙත යොමු කළ යුතු අතර ඒ පිළිබඳ පාලක සභාවේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු වේ.

58. මෙම අතුරු ව්‍යවස්ථාවේ,

**''උපදේශක සභාව''** යන්නෙන් අදහස් වන්නේ නිලවරණය පැවැත්වීම පිළිබඳව නිලවරණ නිලධාරියා, නියෝජ්‍ය නිලවරණ නිලධාරියා, සහකාර නිලවරණ නිලධාරියා සහ තේරීම්භාර නිලධාරියා යන නිලධාරීන්ට උපදෙස් දීම සඳහා, ප්‍රධාන විධායක නිලධාරියා විසින් පත් කරන කමිටුවක් වේ.

**''සහකාර නිලවරණ නිලධාරියා''** යන්නෙන් අදහස් වන්නේ එක් එක් පීඨ ශිෂ්‍ය සංගමයේ සාමාජිකයන් **පහළොස් (15)** දෙනා සහ පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයන් දෙදෙනා (02) තෝරා පත් කර ගැනීමේ නිලවරණයේ දී, නිලවරණ නිලධාරියා වෙනුවෙන් නාම යෝජනා පත්‍ර භාර ගැනීමේ අවශ්‍යතාව සඳහා, ප්‍රධාන විධායක නිලධාරියා විසින් පත් කළ යුතු, ප්‍රාදේශීය මධ්‍යස්ථානයක නිලධාරියෙක් වේ.

**"විගණන නිලධාරී"** යනුවෙන් අදහස් කරනුයේ විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගමයේ හෝ ඕනෑම පීඨ ශිෂ්‍ය සංගමයක ගිණුම් විගණනය කිරීම සඳහා ප්‍රධාන විධායක නිලධාරියා විසින් පත් කළ යුතු ඕනෑම විගණන නිලධාරියෙකි.

**"පාලක සභාව"** යනුවෙන් අදහස් වනුයේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභාවයි.

**"පීඨාධිපති"** යනුවෙන් අදහස් වනුයේ එක් එක් පීඨයක පීඨාධිපති හෝ එම අවස්ථාවේ පීඨාධිපති වෙනුවෙන් තාවකාලිකව වැඩ බලන තැනැත්තා වේ.

**''නියෝජ්‍ය නිලවරණ නිලධාරියා''** යන්නෙන් අදහස් වන්නේ එක් එක් පීඨ ශිෂ්‍ය සංගමය සඳහා වන සාමාජිකයින් පහළොස් **(15)** දෙනා සහ පීඨ සභා ශිෂ්‍ය නියෝජිතයන් දෙදෙනා (02) තෝරා ගැනීම සඳහා වන නිලවරණය මෙහෙයවීමේ අරමුණ සඳහා නිලවරණ නිලධාරියා නොමැති අවස්ථාවක සහ/හෝ නිලවරණ නිළධාරියාගේ උපදෙස් පරිදි කටයුතු කිරීම සඳහා ප්‍රධාන විධායක නිලධාරියා විසින් පත් කළ යුතු නිලධාරියා වේ.

**''නිලවරණ පණිවුඩය''** යනුවෙන් අදහස් වන්නේ නිලවරණ නිලධාරියා විසින් නිලවරණය ප්‍රකාශයට පත් කරමින් සියලුම ප්‍රාදේශීය මධ්‍යස්ථාන හා අධ්‍යයන මධ්‍යස්ථාන තුල ප්‍රදර්ශනය කරන පණිවුඩය වේ.

**''නිලවරණ නිලධාරියා''** යන්නෙන් අදහස් වන්නේ එක් එක් පීඨ ශිෂ්‍ය සංගමය සඳහා වන සාමාජිකයින් පහළොස් **(15)** දෙනා සහ පීඨ සභා ශිෂ්‍ය නියෝජිතයන් දෙදෙනා (02) තෝරා ගැනීම සඳහා වන නිලවරණය මෙහෙයවීමේ අරමුණ සඳහා ප්‍රධාන විධායක නිලධාරියා විසින් පත් කළ යුතු නිලධාරියා වේ.

**"පීඨය"** යනුවෙන් අදහස් වන්නේ සංශෝධිත 1990 අංක 01 දරන විවෘත විශ්වවිද්‍යාල නියමාවලිය යටතේ, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිහිටුවන ලද ඕනෑම පීඨයක් වේ.

**"නිරීක්ෂක සංචිතය"** යන්නෙන් අදහස් වනුයේ, නිලවරණය අවසානයේ දී, පීඨ ශිෂ්‍ය සංගමයේ සාමාජිකයන් ලෙස හෝ පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයන් ලෙස හෝ තෝරා පත් කර ගත් ලෙස ප්‍රකාශිත නොවූ, එක් එක් ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි එක් එක් පීඨයන්ගෙන් ඊළඟ වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත් ඉතිරි ශිෂ්‍ය සංඛ්‍යාව වේ. "ප්‍රධාන විධායක නිලධාරී" යන්නෙන් අදහස් වනුයේ ශ්‍රී ලංකා විවෘත

**"ප්‍රධාන විෂායක නිළධාරී"** යන්නෙන් අදහස් වනුයේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ උපකුලපති හෝ උපකුලපති වෙනුවට එම අවස්ථාව සඳහා තාවකාලිකව වැඩ බලන වෙනත් ඕනෑම තැනැත්තෙක් වේ.

**"අධ්‍යයන වැඩ සටහන"** යන්නෙන් අදහස් වනුයේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් මෙහෙයවනු ලබන උපාධි මට්ටමේ අධ්‍යයන වැඩ සටහනක් වේ.

**''ප්‍රාදේශිය මධ්‍යස්ථානය''** යන්නෙන් අදහස් වන්නේ විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභාව මගින් ප්‍රාදේශීය මධ්‍යස්ථාක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද මධ්‍යස්ථානයක් වේ.

**"ලියාපදිංචි ශිෂ්‍යයකු"** (මෙම අතුරු ව්‍යවස්ථාවේ අරමුණ සඳහා) යන්නෙන් අදහස් වනුයේ යම්කිසි අධ්‍යයන වැඩසටහනක තුන් වන (3) මට්ටමේ සිට හය වන (6) මට්ටම

දක්වා ලියාපදිංචි වී ඇති ශිෂ්‍යයෙකු වේ. යම් මට්ටමකදී අවසාන පරීක්ෂණ සඳහා පෙනී සිට ප්‍රතිඵල නිකුත් වීම අපේක්ෂාවෙන් සිටින සිසුන් ද මෙයට අයත් වේ. එහෙත් පූර්ව උපාධි පාඨමාලා, පශ්චාත් උපාධි පාඨමාලා, අඛණ්ඩ අධ්‍යයන පාඨමාලාවන් හෝ ඒකාංගික පාඨමාලාවන් හි ලියාපදිංචි වී ඇති සිසුන් මේ සඳහා ඇතුළත් නොවේ.

**"ලේඛකාධිකාරී"** යන්නෙන් අදහස් වනුයේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී හෝ ලේඛකාධිකාරී වෙනුවෙන් එම අවස්ථාව සඳහා තාවකාලිකව වැඩ බලන වෙනත් ඕනෑම තැනැත්තෙක් වේ.

**"තේරීම් භාර නිලධාරී"** යන්නෙන් අදහස් වනුයේ ඡන්ද මධ්‍යස්ථානයක නිලවරණ මධ්‍යස්ථානයක, නිලවරණයක් පැවැත්වීමට සහ ඡන්ද ගණන් කිරීම සඳහා ප්‍රධාන විධායක නිලධාරියා විසින් පත් කළ යුතු නිලධාරියා වේ.

**"ශිෂ්‍ය සංගම් වර්ෂය"** යනු පාලක සභාව වෙනත් ආකාරයකින් තීරණය කළහොත් මිස පීඨ ශිෂ්‍ය සංගමයක් සඳහා වන සාමාජිකයින් පහළොස් **(15)** දෙනා තෝරාපත් කර ගැනීම අවසන් වූ දින සිට ආරම්භ වන එක් ලිත් වර්ෂයකි.

**''පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයන්''** යනුවෙන් අදහස් වන්නේ නිලවරණය අවසන් වීමෙන් පසුව එළඹෙන වසරක කාලයක් සඳහා එක් එක් පීඨ සභාව නියෝජනය කිරීම වෙනුවෙන් නිලවරණයක් මගින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු (02) වේ.

**"විශ්වවිද්‍යාල පනත"** යනුවෙන් අදහස් කෙරෙනුයේ සංශෝධිත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතයි.

**''විශ්වවිද්‍යාලය''** යන්නෙන් අදහස් වන්නේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය වේ.

59. මෙම අතුරු ව්‍යවස්ථාවේ, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වන අවස්ථාවකදී, ඉංග්‍රීසි භාෂා පාඨය බලපැවැත්විය යුතු වේ.

## පළමු වැනි උපලේඛනය

**(අ) පීඨ ශිෂ්‍ය සංගමයක් සඳහා වන නාමයෝජනා පත්‍රයක ආදර්ශ ආකෘතිය**

නිලවරණ නිලධාරියා වෙත,
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

* ඉංජිනේරු තාක්ෂණ/මානව හා සමාජ විද්‍යා/ස්වභාවික විද්‍යා/ අධ්‍යාපන/සෞඛ්‍යය විද්‍යා පීඨයේ පීඨ ශිෂ්‍ය සංගමය.

නාමයෝජනා පත්‍රය

මෙහි පහත අත්සන් කරන යෝජක සහ ස්ථිර කරුවන් වන අපි,මෙම අතුරු ව්‍යවස්ථාවේ නිර්වචනය කරන ඇති පරිදි ලියා පදිංචි ශිෂ්‍යයකු වන, .....................................
........................................................................................................................
(අපේක්ෂකයාගේ සම්පූර්ණ නම) යන අය ............................ ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ
................................................... (පීඨ ශිෂ්‍ය සංගමයේ නම) සාමාජිකයෙකු ලෙස තෝරා පත් කිරීම සඳහා අපේක්ෂයකු ලෙස නම් කර සිටිමු.
එකී අපේක්ෂකයා ඉහත සඳහන් ....................................... පීඨයේ ලියා පදිංචි ශිෂ්‍යයකු බවත්, මෙම අතුරු ව්‍යවස්ථාවේ III වන කොටස අනුව නිලවරණය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබා ඇති බවත් අපි සහතික කරමු.

අපේක්ෂකයාගේ නම :
ශිෂ්‍ය ලියාපදිංචි අංකය :
ලිපිනය :

..............................
අපේක්ෂකයාගේ අත්සන

යෝජකගේ සම්පූර්ණ නම :
ශිෂ්‍ය ලියාපදිංචි අංකය :
ලිපිනය :

..............................
යෝජකගේ අත්සන

ස්ථිරකරුගේ සම්පූර්ණ නම :
ශිෂ්‍ය ලියාපදිංචි අංකය :
ලිපිනය :

..............................
ස්ථිරකරුගේ අත්සන

**අදාල නොවන වචන කපා හරින්න.*

මා ඉදිරිපිටදී අත්සන් තබන ලදි.

...........................................................
නිලවරණ නිලධාරියා සහ හෝ සහකාර නිලවරණ නිලධාරියා

(ආ) ………………………………………….**පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයන් සඳහා වන නාමයෝජනා පත්‍රයක ආදර්ශ ආකෘතිය**

නිලවරණ නිලධාරියා වෙත,
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

* ඉංජිනේරු තාක්‍ෂණ/මානව හා සමාජ විද්‍යා/ස්වභාවික විද්‍යා/ අධ්‍යාපන/සෞඛ්‍යය විද්‍යා පීඨයේ පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයන්.

නාමයෝජනා පත්‍රය

මෙහි පහත අත්සන් කරන යෝජක සහ ස්ථිර කරුවන් වන අපි,මෙම අතුරු ව්‍යවස්ථාවේ නිර්වචනය කරන ඇති පරිදි ලියා පදිංචි ශිෂ්‍යයකු වන ………..……………………

……………………………………………………………………..........................................

(අපේක්ෂකයාගේ සම්පූර්ණ නම) යන අය ………………………… ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ

……………………………..……..………… (පීඨයේ නම) පීඨයේ පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයකු ලෙස තෝරා පත් කිරීම සඳහා අපේක්‍ෂයකු ලෙස නම් කර සිටිමු.

එකී අපේක්‍ෂකයා ඉහත සඳහන් ……………………………...... පීඨයේ ලියා පදිංචි ශිෂ්‍යයකු බවත්, මෙම අතුරු ව්‍යවස්ථාවේ ෂෂෂ වන කොටස අනුව නිලවරණය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබා ඇති බවත් අපි සහතික කරමු.

අපේක්‍ෂකයාගේ නම :
ශිෂ්‍ය ලියාපදිංචි අංකය :
ලිපිනය :

.......……………………
අපේක්‍ෂකයාගේ අත්සන

යෝජකගේ සම්පූර්ණ නම :
ශිෂ්‍ය ලියාපදිංචි අංකය :
ලිපිනය :

.......……………………
යෝජකගේ අත්සන

ස්ථිරකරුගේ සම්පූර්ණ නම :
ශිෂ්‍ය ලියාපදිංචි අංකය :
ලිපිනය :

.......……………………
ස්ථිරකරුගේ අත්සන

***අදාල නොවන වචන කපා හරින්න.**

මා ඉදිරිපිටදී අත්සන් තබන ලදි.

…………………………………………………………

නිලවරණ නිලධාරියා සහරැ හෝ සහකාර නිලවරණ නිලධාරියා

## දෙවැනි උපලේඛනය

- විරෝධතා ඉදිරිපත් කරන ශිෂ්‍යයාගේ සම්පූර්ණ නම:
- විරෝධතා ඉදිරිපත් කරන ශිෂ්‍යයාගේ නම, මුලකුරු සමග:
- ලියාපදිංචි අංකය:
- අධ්‍යයන වැඩසටහන:
- පීඨය:
- විරෝධතා එල්ලවන අපේක්ෂකයාගේ සම්පූර්ණ නම:
- අපේක්ෂකයාගේ ලියාපදිංචි අංකය:
- අපේක්ෂකයා තරග කරනු ලබන පීඨ ශිෂ්‍ය සංගමයට/ශිෂ්‍ය නියෝජිතයකු වීමට තරග කරනු ලබන පීඨ සභාව අයත් පීඨය:
- සංශෝධිත 2015 අංක 3 දරණ ශිෂ්‍ය සංගම් අතුරු ව්‍යවස්ථාවේ අදාල ඡේදයන් උපුටා දක්වමින් විරෝධතා සඳහා වන හේතු :
- විරෝධතා ඉදිරිපත් කරන ස්ථානය :
- විරෝධතා ඉදිරිපත් කරන දිනය:
- විරෝධතා ඉදිරිපත් කරන වේලාව:

……………………………………………

විරෝධතා ඉදිරිපත් කරන ශිෂ්‍යයාගේ අත්සන

---

## ලැබුණු බවට සහතිකය

…………………………………… වෙත

…………………………………… දින වේලාවෙන් …………… ට …………………………………….. පීඨයේ පීඨ ශිෂ්‍ය සංගමයේ සාමාජිකයෙකුට/ පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයකු වීම සඳහා වන නිලවරණයට ඉදිරිපත්ව සිටින ……………………………………………………………...............ට එරෙහිව ඔබ විසින් ඉදිරිපත් කරන ලද විරෝධතා ප්‍රකාශය ලැබුණු බව මෙයින් සහතික කරමි.

දිනය:………………..

…………………………………

නිලවරණ නිලධාරියා සහ/ හෝ සහකාර නිලවරණ නිලධාරියා

<u>තුන්වැනි උපලේඛණය</u>

- ප්‍රතික්ෂේප කිරීමට විරෝධතා ඉදිරිපත් කරන අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :

- ප්‍රතික්ෂේප කිරීමට විරෝධතා ඉදිරිපත් කරන අපේක්ෂකයාගේ නම, මුලකුරු සමග:

- ලියාපදිංචි අංකය:

- අධ්‍යයන වැඩසටහන:

- පීඨය:

- අපේක්ෂකයා තරග කරනු ලබන පීඨ ශිෂ්‍ය සංගමයරැශිෂ්‍ය නියෝජිතයකු වීමට තරග කරනු ලබන පීඨ සභාව අයත් පීඨය:

- සංශෝධිත 2015 අංක 3 දරණ ශිෂ්‍ය සංගම් අතුරු ව්‍යවස්ථාවේ අදාල ඡේදයන් උපුටා දක්වමින් විරෝධතා සඳහා වන හේතු :

- විරෝධතා ඉදිරිපත් කරන ස්ථානය :
- විරෝධතා ඉදිරිපත් කරන දිනය:
- විරෝධතා ඉදිරිපත් කරන වේලාව:

.................................................
ප්‍රතික්ෂේප කිරීමට විරෝධතා ඉදිරිපත් කරන
අපේක්ෂකයාගේ අත්සන

---

<u>ලැබුණු බවට සහතිකය</u>

.......................................... වෙත

.................................................................දින වේලාවෙන් ............ට

.......................................... පීඨයේ පීඨ ශිෂ්‍ය සංගමයේ සාමාජිකයෙකු රැ පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයකු වීම සඳහා ඔබ විසින් ඉදිරිපත් කළ නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව ඉදිරිපත් කළ විරෝධතා ප්‍රකාශය ලැබුණු බව මෙයින් සහතික කරමි.

දිනය:………………..

……………………………………
නිලවරණ නිලධාරියා සහ/ හෝ
සහකාර නිලවරණ නිලධාරියා

## සිව්වැනි උපලේඛනය

**(අ)**

උපපත්‍රිකා අංකය: **…………………………………………………………………......**

ලියාපදිංචි අංකය: ………………………………………………………………......

පීඨය: ………………………………………………………………......

ප්‍රාදේශියමධ්‍යස්ථානය: ……………………………………………………………

අදාළ ප්‍රාදේශිය මධ්‍යස්ථානයෙන් එක් එක් පීඨ ශිෂ්‍ය සංගමයට තෝරාගැනීම සඳහා ඔබේ කැමැත්ත දක්වන එක් එක් අපේක්ෂකයාගේ නමට ඉදිරියෙන් **"X"** ලකුණ යොදමින් අපේක්ෂකයින් තවතවත් දෙනෙකු දක්වා නම් කරන්න.

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

* අපේක්ෂකයින්ගේ නම් අකාරාදි පිළිවෙලට සටහන් කළ යුතුය.

(ආ)

උපපත්‍රිකා අංකය: ………………………………………………………………......

ලියාපදිංචි අංකය: ………………………………………………………………......

පීඨය: ………………………………………………………………......

ප්‍රාදේශිය මධ්‍යස්ථානය: ………………………………………………………………......

එක් එක් පීඨයේ පීඨ සභාවේ ශිෂ්‍ය නියෝජිතයකු වීම සඳහා ඔබේ කැමැත්ත දක්වන එක් එක් අපේක්ෂකයාගේ නමට ඉදිරියෙන් **"X"** ලකුණ යොදමින් අපේක්ෂකයින් දෙදෙනෙකු (02) නම් කරන්න.

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

…………………………………………………………………………………

* අපේක්ෂකයින්ගේ නම් අකාරාදි පිළිවෙලට සටහන් කළ යුතුය.

**පස්වැනි උපලේඛනය**

අදාළ එකතු කරන ලද ප්‍රාදේශිය මධ්‍යස්ථානයන්ට අනුව , එක් එක් පීඨයේ, එක් එක් පීඨ ශිෂ්‍ය සංගමයට අදාළ වන නියෝජිතයන් සංඛ්‍යාව.

| ප්‍රාදේශිය මධ්‍යස්ථානය | එකතු වන අධ්‍යයන මධ්‍යස්ථානයන් | ශිෂ්‍යයන් සංඛ්‍යයව | | වෙන් කරන ලද ශිෂ්‍යය නියෝජිතයන් ගණන |
|---|---|---|---|---|
| කොළඹ ප්‍රාදේශිය මධ්‍යස්ථානය | ගම්පහ, කළුතර, රත්නපුර | අධ්‍ය. | | |
| | | ඉ.තා. | | |
| | | මා.ස.වි. | | |
| | | ස්.වි. | | |
| | | සෞ.වි. | | |
| නුවර ප්‍රාදේශිය මධ්‍යස්ථානය | කෑගල්ල, හැටන් | අධ්‍ය. | | |
| | | ඉ.තා. | | |
| | | මා.ස.වි. | | |
| | | ස්.වි. | | |
| | | සෞ.වි. | | |
| මාතර ප්‍රාදේශිය මධ්‍යස්ථානය | ගාල්ල, අම්බලන්තොට | අධ්‍ය. | | |
| | | ඉ.තා. | | |
| | | මා.ස.වි. | | |
| | | ස්.වි. | | |
| | | සෞ.වි. | | |
| මඩකලපුව | අම්පාර, ත්‍රිකුණාමලය | අධ්‍ය. | | |
| | | ඉ.තා. | | |
| | | මා.ස.වි. | | |
| | | ස්.වි. | | |
| | | සෞ.වි. | | |
| යාපනය ප්‍රාදේශිය මධ්‍යස්ථානය | කිලිනොච්චි, වව්නියා, මුලතිව් | අධ්‍ය. | | |
| | | ඉ.තා. | | |
| | | මා.ස.වි. | | |
| | | ස්.වි. | | |
| | | සෞ.වි. | | |
| අනුරාධපුරය ප්‍රාදේශිය මධ්‍යස්ථානය | පොළොන්නරුව | අධ්‍ය. | | |
| | | ඉ.තා. | | |
| | | මා.ස.වි. | | |
| | | ස්.වි. | | |
| | | සෞ.වි. | | |
| කුරුණෑගල ප්‍රාදේශිය මධ්‍යස්ථානය | කුලියාපිටිය, පුත්තලම | අධ්‍ය. | | |
| | | ඉ.තා. | | |
| | | මා.ස.වි. | | |
| | | ස්.වි. | | |
| | | සෞ.වි. | | |
| බදුල්ල | බණ්ඩාරවෙල, මොණරාගල | අධ්‍ය. | | |
| | | ඉ.තා. | | |
| | | මා.ස.වි. | | |
| | | ස්.වි. | | |
| | | සෞ.වි. | | |